# 18

# වාසනාවන්

ඕනෑ ම රටක සුන්දරත්වයට සතුන්, ගහකොළ, ඇළදොළ ගංගා ආදිය හේතු වේ. අපේ රට ද සුන්දර පරිසරයකට හිමිකම් කියයි. එය අපට මහත් අභිමානයකි. ඩබ්ලියු. ඒ. අබේසිංහ විසින් රචනා කරන ලද මෙම නිර්මාණය අපේ රටේ සුන්දරත්වය ගැන කියැවෙන්නකි.

මල් රොනට බමරු වඩිනා
ලිය මඬුලු නිබඳ නිලනා
ඇල් පවන ගිමන නිවනා
නිල් දෙරණ වාසනාවන්

ගල් කුළෙන් කුළට හැපෙනා
දුල් රිදී දියෙන සොබනා
දිය කඳුරු ගලා බසිනා
නිල් දෙරණ වාසනාවන්

තුරු සිරස අරා සිටිනා
සොඳ බටිති මලිති නොමිනා
යස මිහිරි සින්දු කියනා
නිල් දෙරණ වාසනාවන්

කෙළි මතින ඉපිල පිහිනා
නෙක දණ්ඩි පැටව් නටනා
දිය කඩිති සිඳී නොයනා
නිල් දෙරණ වාසනාවන්

## අවබෝධය

1. වාසනාවන් යන නිර්මාණයේ තේමාව කුමක් ද?
2. මෙහි සඳහන් ආකාරයට අපේ රටට උරුම ස්වාභාවික සම්පත් මොනවා ද?
3. රචකයා අපේ රට 'නිල් දෙරණ' ලෙස හඳුන්වා ඇත්තේ ඇයි?
4. මේ නිර්මාණය කියවන විට අපේ රටේ සුන්දරත්වය ගැන ඔබේ සිතට එන හැඟීම් පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.
5. 'තුරු සිරස', 'කෙළි මතින' යන වචනවල අර්ථ ලියන්න.

## ලිඛිත අභ්‍යාස

1. **මෙහි පහත දැක්වෙන අදහස හැඟවෙන ගී පද උපුටා දක්වන්න.**
   i. කඳු මුදුන්වලින් ගලා හැලෙන රිදී පැහැති දිය දහරා ය.
   ii. තුරු මුදුන් හී කුරුල්ලෝ මිහිරි නාද පවත්වති.
   iii. සිහිල් සුළඟින් ග්‍රීෂ්මය නිවෙයි.
2. **පහත දැක්වෙන වචනවලට සමානාර්ථ දෙන පද ගීයෙන් උපුටා ලියන්න.**

   i. ග්‍රීෂ්මය    ii. ක්‍රීඩා    iii. හිස
   iv. ලතා මණ්ඩපය    v. පොළව

3. **පහත දැක්වෙන පද්‍ය පාඨ ඔබේ වචනයෙන් ලියන්න.**

   i. මල් රොනට බඹරු වඩිනා
   ලිය මඩුලු නිබඳ නිලනා
   ii. ගල් කුළෙන් කුළට හැපෙනා
   දුල් රිදී දියෙන් සොබනා
   දිය කඳුරු ගලා බසිනා
   iii. කෙළි මතින ඉපිල පිහිනා
   නෙක දණ්ඩි පැටව් නටනා
   දිය කඩිති සිඳී නොයනා

## ප්‍රායෝගික අභ්‍යාස

1. **මේ නිර්මාණය පන්තියේ දී තාලානුකූල ව ගායනා කරන්න.**
2. **අපේ රට ගැන ලියැවී ඇති ගද්‍ය පද්‍ය නිර්මාණ එක්රැස් කොට පොත් පිංචක් සකස් කරන්න.**